චක්‍රලේඛ අංකය. 97/5/11.

මගේ අංකය. 4/ගුරුඅ/1/3099/විවිධ.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
' ඉසුරුපාය ', බත්තරමුල්ල.
1997 ජූලි මස 17 දින.

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභා ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කලාප භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්.

ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම.
ගෞරව උපාධිධාරීන්.

1997.03.11 දින හා අංක. 966/5 දරණ ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට කරන ලද සංශෝධනය ඇතුළත් ගැසට් නිවේදනය හා ඊට අනුගාමීව ම විසින් නිකුත් කරනු ලැබ ඇති,

1997.04.30 – අංක. 97/5,
1997.05.19 – අංක. 97/5/1.

යන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු මැනවි.

ගෞරව උපාධිධාරියා යන්න විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් අයුරු නිර්වචනය කරනු ලැබ ඇති බව මෙයින් දන්වමි. එය මෙසේය.

" ගෞරව උපාධිධාරියා යනුවෙන් සලකනු ලබන්නේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධි පාඨමාලාවක් හදාරා පන්ති සාමාර්ථයක් ලබා ගත් තැනැත්තාය.

යම් විශේෂිත හේතුවක් මත අයදුම්කරු පසු වාරයකදී පෙනී සිටින විභාගයකදී ගෞරව සාමාර්ථයකට සුදුසු යයි තීරණය වන අවස්ථාවකදී විස තමා සුදුසුකම් ලැබූ පළමු අවස්ථාවේදීම එම පරීක්ෂණයට පෙනී නොසිටියේ නම් හා එසේ පෙනී සිටි පළමු අවස්ථාවේදීම අදාළ පරීක්ෂණයෙන් සමත් නොවූයේ නම් මෙසේ ගෞරව උපාධි නාමය ලැබීමට හිමිකම් නොලබයි".

මේ අනුව ගෞරව උපාධිධාරීන් හඳුනාගෙන ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කිරීම මැනවි. මේ සම්බන්ධව මගේ අංක. 97/5/1 සහ 1997.05.19 දින දරණ චක්‍රලේඛයෙහි උපදෙස් මේ අනුව සංශෝධනය කෙරෙන බවද කරුණාවෙන් සලකන්න.

( සේනානායක උපසේන )